# 19

# බෞද්ධ සාහිත්‍යය හැඳින ගනිමු

**රසික** ප්‍රබුද්ධ ශිෂ්‍යයෙකි. ඔහුගේ පන්තියේ සිංහල විෂයට එදින නියමිත පාඩම වූයේ සද්ධර්ම රත්නාවලියේ මට්ටකුණ්ඩලී වස්තුවයි. එහි එන උපමා අගය කරමින් ගුරුතුමා කරන විස්තරයට රසිකගේ සිත තදින් ඇදී යයි. තමා කියවා ඇති සමහර නවකතා, කෙටිකතාවලට වඩා බෞද්ධ සාහිත්‍යයේ එන කතා මොනතරම් රසවත් දැයි රසිකට සිතෙයි. එද ඔහු නිවසට පැමිණෙන තුරු ම සිතෙහි රැවුපිළිරැව් දුන්නේ මට්ටකුණ්ඩලී කතාවමයි.

"පය බරවායෙට පිටිකර බෙහෙත් බඳිනා සේ"

"ඇස් සරහන්න තොල අඳුන් ගානා සේ"

"ආඳ යවා තබාලා වල්පත අතට ගත්තා සේ"

"කෙතෙක් බත් කැවත් පැන් පූවොත් මුත් පිපාස සන් නොසිඳෙන්නා සේ"

"පැන් වත්කළමනා ගසට හුණුපැන් වත්කරන්නා සේ"

මොන තරම් ලස්සන උපමා ද? පියා සමග මේවා ගැන කතා කරන තුරු රසිකට ඉස් පාසුවක් නැත.

දිගු කලක් විදුහල්පතිවරයකු ලෙස සේවය කර විශ්‍රාම සුවයෙන් පසුවන තම පියා සාහිත්‍ය රසවින්දනය ගැන දක්වන උනන්දුව පිළිබඳ ව රසික දනී. එතුමා විවේකී ව පොතක් කියවමින් සිටි අඹ ගහ යටට හෙතෙම ගියේ තම මතකයේ රැඳුණු සද්ධර්ම රත්නාවලි උපමාවන් ද මුමුණමිනි.

"පුතා අද මොකද අමුතු සතුටකින්" යැයි පියා විමසුවේ පොතේ කියවමින් සිටි පිටුවට සලකුණක් තබමිනි. තමන් හදළ මට්ටකුණ්ඩලී කතා වස්තුවේ රසවත් භාවය එහි උපමා භාවිතයේ අපූර්වත්වය පිළිබඳ ව රසික සිය පියාණන්ට පැවසූ විට එතුමා බෞද්ධ සාහිත්‍යය ගැන පුතා දක්වන උනන්දුව අගය කෙළේ ය. මට්ටකුණ්ඩලී වස්තුව සාහිත්‍ය රසයෙන් පමණක් නොව ධර්ම රසයෙන් ද අනූන වූවක් බව ද පැවසී ය. රසික පියා වෙත ඉදිරිපත් කළ ප්‍රශ්න නිසා එම "අඹ සෙවන" බෞද්ධ සාහිත්‍යය පිළිබඳ පාඩමක්

කියා දෙන තැනක් බවට පත් විය. රසිකට සිය පියා කියා දුන් කරුණුවල සාරාංශය මෙසේ ය.

මිහිඳු මහ රහතන් වහන්සේගෙන් අප රටට ලැබුණේ ථේරවාදී බුදු දහම පමණක් නො වේ. එහි මාධ්‍ය භාෂාව වූ පාලියෙන් ලියවුණු සාහිත්‍යයකුත් ලැබිණි. ත්‍රිපිටකය ඇතුළු එම සාහිත්‍යය ආරක්ෂා කරන ලද්දේ, පෝෂණය කරනු ලැබුවේ අපේ උගත් මහ තෙරණුවරුන් විසින් ය. සිංහල භාෂා සාහිත්‍යයත් පාලි මූලාශ්‍රය ඇසුරෙන් ම වැඩි දියුණු විය. බුදු ගුණ, බුදු බණ, බුදු සිරිත වර්ණනා කරමින් ගිහි පැවිදි උගතුන් විසින් රචනා කරන ලද ඉතා රසවත් මෙන් ම හරවත් ගද්‍ය පද්‍ය කෘතිවලින් අපේ සාහිත්‍ය වංශය පෝෂණය විය. ඒවා අතර අප අවශ්‍යයෙන් ම හැඳින ගත යුතු මූලික කෘති කිහිපයක් පහත දැක්වේ.




## බුත්සරණ

මෙම පොත විද්‍යාචක්‍රවර්ති නම් මහා පඬිවරයකු විසින් බුදුගුණ වැණීම සඳහා ලියන ලද්දකි. මෙයට "අමෘතාවහ" යන නම ද යෙදී ඇත. පොත නිමා කරන්නේ අමෘතා වහ නම් වූ බුද්ධ චරිතය නිමි කියා ය. සෑම බුදුගුණ ප්‍රකාශයක් අවසානයේ **''බුදුන් සරණ යෙමියි බුත්සරණ යා යුතු''** යනුවෙන් සඳහන් වන බැවින් බුත්සරණ යන ජනප්‍රිය නාමයෙන් ප්‍රසිද්ධ වී තිබේ. මෙහි මුල් පරිච්ඡේදවල බුදුරජාණන් වහන්සේගේ දේශනා විලාශය, රූපකාය සම්පත් ආදිය විස්තර වෙයි. අවසන් පරිච්ඡේදවල වෙස්සන්තර ජාතක කතාවත්, විසිතුරු උපමා යොද ගනිමින් කරන ලද බුදු ගුණ වර්ණනාත් ඇතුළත් වෙයි. විද්‍යාචක්‍රවර්ති පඬිවරයාගේ ධර්ම ශාස්ත්‍ර ඥානයත්, නිර්මාණ කුසලතාවත් ඉතා

හොඳින් ප්‍රකට වන ග්‍රන්ථයකි, මෙය. මෙහි නාලාගිරි දමනය පමණක් කියවීමෙන් වුව ද එය වටහාගත හැකි ය.

කියවන්නන් කටට, අසන්නන් කනට සුව එළවන භාෂාවකින් හා රචනා ශෛලියකින් ලියවුණු, මෙතරම් සාරවත් මෙතරම් රසවත් මෙතරම් ව්‍යක්ත අනෙක් සිංහල ග්‍රන්ථයක් නැතැයි ශ්‍රේෂ්ඨ ප්‍රාචීන පඬිවරයකු වූ අතිගරු වැලිවිටියේ සෝරත නාහිමිපාණන් වහන්සේ පවසති.

## දහම්සරණ හා සඟසරණ

ධර්ම රත්නය තේමා කොටගෙන දහම් සරණත් සංඝරත්නය තේමා කොටගෙන සඟ සරණත් ලියවී ඇත. ඇතැමකුගේ මතය මේ පොත් දෙක ද විද්‍යාචක්‍රවර්ති පඬිවරයා විසින් ලියන ලද බවයි. නමුත් ග්‍රන්ථ තුනෙහි භාෂා ශෛලිය හා රචනා විලාශය අනුව ඉහත කී මතය පිළිගත නො හැකි බවයි, උගතුන් වැඩිදෙනකු කියන්නේ. බුත්සරණ පොළොන්නරු රාජධානි සමයේත්, දහම් සරණ හා සඟ සරණ දඹදෙණි රාජ සමයෙන් පසුවත් රචනා කරන ලදැයි සැලකේ.

## අමාවතුර

මෙය ද බුද්ධ චරිත ග්‍රන්ථයකි. ලියා තිබෙන්නේ ගුරුළුගෝමී නම් පඬිවරයකු විසිනි. එහි විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ පුරිසදම්ම සාරථී ගුණයයි. උතුම් බුදුගුණ බලයෙන් විවිධ මිනිසුන්, යක්ෂයින්, දෙවියන්, බ්‍රහ්මයන් පමණක් නො ව දරුණු සතුන් පවා දමනය කළ ආකාරය මෙහි විස්තර වේ. අප හොඳට අසා පුරුදු අංගුලිමාල දමනය, ආලවක දමනය, නාලාගිරි දමනය ආදිය ද ඒ අතර වේ. මේවා පිළිබඳ පාලි භාෂාවෙන් තිබුණු විස්තර කියවීමට අපහසු සාමාන්‍ය ජනතාව සඳහා ය, අමාවතුර රචනා කර තිබෙන්නේ.

'අප බුදුන් ....... තුන් ලොව්හි සැරිසැරූ විසම පුරුෂයන් දමා අමාමහ නිවන් පැමිණ වූ සේ නොවියත් හුදී ජනන් සඳහා සිය බසින් මා විසින් සැබෙවින් දක්වනු ලැබේ' යි අමාවතුර කතුතුමා පවසයි.

## සද්ධර්මරත්නාවලිය

මෙය පාලි ධම්මපදට්ඨ කථාව ඇසුරෙන් ලියන ලද්දකි. කතුවරයා දඹදෙණි රාජධානි සමයේ වැඩසිටි ධර්මසේන නම් ස්වාමීන්වහන්සේ නමකි. 'සදහම් නමැති රුවන් ඇමුණු වැල' යන අර්ථය පොතේ නමින් ලැබෙයි. විසිතුරු උපමා යෙදීමේ අපූරු කුසලතාවක් ධර්මසේන හිමියන්ට තිබුණු ආකාරය සද්ධර්ම රත්නාවලියෙන් පැහැදිලි වේ. කර්ම සහ කර්ම විපාක, පුනර්භවය ආදි ගැඹුරු දහම් කරුණු තේරුම් ගැනීමට ද මෙම කෘතිය උපකාර වෙයි.

## සද්ධර්මාලංකාරය

පාලියෙන් ලියා ඇති 'රසවාහිනී' නම් බණ කථා පොත ඇසුරෙන් ලියන ලද්දකි, සද්ධර්මාලංකාරය. රසවාහිනියේ නැති, තෙරුවන් වැඳීමේ අනුසස්, දසපුණ්‍ය ක්‍රියා, දානානිසංශ ආදී අතිරේක කරුණු ද මෙහි ඇත. පුද්ගල ආචාර ධර්ම, සමාජ ධර්ම පෝෂණයට සද්ධර්මාලංකාරයේ එන කථා බෙහෙවින් උපකාර වේ. මෙම ග්‍රන්ථය රචනා කර තිබෙන්නේ දේවරක්ෂිත ජයබාහු ධර්මකීර්ති නම් සංඝරාජයන් වහන්සේ විසිනි.

## පූජාවලිය

තෙරුවනට පුදපූජා පැවැත්වීමේ අගය සාකච්ඡා කළ පොත පූජාවලියයි. මෙහි කතුවරයා මයුරපාද පිරුවන්පති බුද්ධපුත්‍ර හිමියන් ය. දඹදෙණියේ රජ කළ දෙවැනි පණ්ඩිත පරාක්‍රමබාහු රජුගේ ඇමතිවරයකු වූ දේවප්‍රතිරාජයන්ගේ ආරාධනාවකට අනුවයි, මෙය ලියා තිබෙන්නේ. මෙහි විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ 'අරහං' ගුණයයි. වේළුවනාරාම පූජා, ජේතවනාරාම පූජා, පූර්වාරාම පූජා ආදී බුද්ධ පූජා වැලක් ම විස්තර වන බැවින් පූජාවලිය නම් විය. පාඨකයා තුළ ශ්‍රද්ධාව ජනිත කිරීමට බෙහෙවින් උපකාර වන අගනා කෘතියකි.

## ජාතක පොත් වහන්සේ

'ජාතක පොත' යයි සඳහන් නො කර, ජාතක පොත් වහන්සේ යයි හඳුන්වනු ලබන්නේ බුදුරජාණන් වහන්සේගේ බෝධිසත්ව චරිත විස්තර කෙරෙන බැවිනි. මෙය ලියා තිබෙන්නේ පාලි ජාතකට්ඨ කථාව ආශ්‍රයෙනි. ජාතක කථා ඉතා රසවත් ය, එමෙන් ම උපදේශාත්මක ය. ප්‍රධාන චරිතය බෝධිසත්ත්වයන් වහන්සේගේ ය. උන් වහන්සේ නිතර ම හැසිරෙන්නේ අන්‍යයන්ට ආදර්ශයක් ගත හැකි පරිද්දෙනි. මේ කථාවලින් විස්තර වන්නේ බෝධිසත්ත්වයන් වහන්සේ පාරමිතා පිරූ ආකාරයයි. කියවන්නන් තුළත් පරිත්‍යාගශීලිත්වය, උත්සාහවන්තකම, ඉවසීම, අධිෂ්ඨානය වැනි ගුණාංග ඇති වීමට මෙම කතා උපකාර වෙයි. කතුවරුන් කිහිප දෙනකුගේ කෘතියක් ලෙසයි ජාතක

පොත් වහන්සේ සැලකෙන්නේ. මෙහි ජාතක පන්සිය හතලිස් හතක් ඇතුළත් ව තිබේ. පන්සිය පනහක් ලෙස දක්වෙන්නේ ආසන්න සංඛ්‍යා වශයෙනි.

### ධර්මප්‍රදීපිකාව

ගුරුළුගෝමී පඬිවරයා විසින් රචනා කරන ලද විශිෂ්ට ධර්ම ග්‍රන්ථයකි. මෙය ලියා තිබෙන්නේ පාලි මහා බෝධි වංශය පදනම් කරගෙනය. විවිධ දහම් කරුණු අධ්‍යයනයට බෙහෙවින් උපකාර වන මෙය කෝෂ ග්‍රන්ථයකට සමාන ය. පාලි ත්‍රිපිටකයෙන් හා අට්ඨකථාවලින් මෙන්ම සංස්කෘත ග්‍රන්ථවලිනුත් කරුණු ගෙන සකස් කර ඇත. ධර්ම ප්‍රදීපිකාවෙන් ගුරුළුගෝමී පඬිතුමාගේ ධර්ම ශාස්ත්‍ර විශාරදත්වය මැනවින් ප්‍රකට වෙයි.

### මුවදෙව්දාවත සහ සසදාවත

පොළොන්නරු රාජධානි සමයේ ලියැවුණු ග්‍රන්ථ දෙකක් සේ සැලකේ. දෙක ම අයත් වන්නේ ගී කාව්‍ය ගණයටයි. මඛාදේව ජාතකය පදනම් කරගෙන මුවදෙව්දාවතත්, සස ජාතකය වස්තු කොටගෙන සසදාවතත් රචනා වී ඇත. නෙක්ඛම්ම පාරමිතාව මඛාදේව ජාතකයෙන් නිරූපණය වන අතර, සස ජාතකයෙන් නිරූපණය වන්නේ දාන පාරමිතාවයි.

### කව්සිළුමිණ

මෙම කෘතිය අයත් වන්නේ ද ගී කාව්‍ය ගණයටය. දඹදෙණියේ රජ කළ දෙවැනි පැරකුම්බා රජ විසින් රචනා කරන ලද්දකැයි සැලකේ. මෙයින් සිදු කර තිබෙන්නේ ජනප්‍රිය ජාතක කතාවක් වන කුස ජාතකය විචිත්‍ර ලෙස කාව්‍යයට නැඟීමයි. මෙය සිංහල සාහිත්‍යයට එක්වුණු පළමු මහා කාව්‍යයයි.

### කාව්‍යශේඛරය

සත්තුභත්ත ජාතකය වස්තු කොට ගෙන රචනා කරන ලද මහා කාව්‍යයකි. කතුවරයා තොටගමුවේ ශ්‍රී රාහුල ස්වාමීන්ද්‍රයන් වහන්සේ ය. සවැනි පැරකුම්බා රජුගේ දියණියක වූ උලකුඩය දේවියගේ ආරාධනාවකට අනුවයි, මෙය රචනා කර තිබෙන්නේ.

මහලු සැමියකු හා තරුණ බිරිඳක එක් වූ පවුලක ආරවුලක් මහා බෝසතාණන් වහන්සේ නිරාකරණය කළ ආකාරය සත්තුභත්ත ජාතකයෙන් කියැවේ. කාව්‍යශේඛරය එම කතාවට සීමා වී නැත. විවිධ උයන් වර්ණනා, වන වර්ණනාදිය ද එහි ඇත. ඉතා ගැඹුරු දහම් කරුණු ද සරල ලෙස ඉදිරිපත් කර තිබේ. එහි භාවනාව හා චතුරාර්ය සත්‍යය හඳුන්වා දෙන අයුරුයි මේ.

| | |
|---|---|
| සිත කිලුටු | කරනා |
| රාගාදි පව් | මඩනා |
| සිතිවිලි | බාවනා |
| දෙකකි විදසුන් සමත | විසිනා |
| | |
| දුක් සමුදය | නිරොද |
| මග සමගින් මෙකී | පද |
| සැබෑ කරුණෙන් | සොඳ |
| එසිවු සස් නම් දනුව | පිරිසිඳ |

## ගුත්තිල කාව්‍යය

ගුත්තිල ජාතක කතාව වස්තු කොටගෙන රචිත ගුත්තිල කාව්‍යය කෝට්ටෙ රාජධානි සමයට අයත් ඉතා උසස් නිර්මාණයකි. වැත්තෑවේ හිමි එහි කතුවරයා ය. සලාවත ජයපාල නම් මන්ත්‍රීවරයාගේ ආරාධනාවෙනි, මෙම කෘතිය ලියා තිබෙන්නේ. ඉතා ලිහිල් භාෂාවෙන් රමණීය ලෙස රචනා කර ඇත. අපි තෙරුවන් වන්දනාවේ දී ගුත්තිල කාව්‍යයේ එන ආරම්භක පද්‍ය භාවිත කිරීමට හුරු වී තිබෙන්නේ ඒවායේ ඇති සරලභාවය සහ අර්ථ රසයෙන් මෙන්ම ශබ්ද රසයෙන් ද අනූනභාවය නිසා ය.

සියපින් සිරින් සරු
දෙතිස් ලකුණින් විසිතුරු
කෙලෙසුන් කෙරෙන් දුරු
වඳිම් මුනි උතුමන් තිලෝගුරු

සපුරා දස පෙරුම්
පළකළ බුදුව මනරම්
හරනා බව බිරම්
වඳිම් අදරින් අනගි සදහම්

තමන් පද වන්දන
කළ පමණකින් නන්දන
නිවන් සැප වින්දන
වඳිම් මහ සඟන මුනි නන්දන

## බුදුගුණාලංකාරය

වීදගම මෛත්‍රේය හිමිපාණන් විසින් රචනා කරන ලද බුදුගුණාලංකාරය, බුදුගුණයට දක්වන සැදැබර උපහාරයක් බඳු ය. බුදුරජාණන් වහන්සේ විසාලා මහනුවරින් තුන් බිය දුරු කිරීම පිළිබඳ කතා පුවත තේමා කර ගෙන රචනා කර ඇත. එය කියවන්නා තුළ මෙන් ම අසන්නන් තුළ ද ශ්‍රද්ධාව ජනිත කරවයි. විසාලා මහනුවරට බුදුරදුන් වැඩමවා ගෙන ගිය පෙරහර පිළිබඳ වර්ණනාව අප ද සිතින් පෙරහරට එක් කරයි.

| | |
|---|---|
| අතින් රැගත් කුසුම් | දමින් |
| සිතින් රැගත් මුනි | පුදමින් |
| බැතින් අයෙක් ඇති | පදමින් |
| නිතින් මුනිඳු යෙති | පුදමින් |

## ලෝවැඩ සඟරාව

ධර්මෝපදේශ රැසක් ලබා දෙන අගනා කාව්‍යයකි, ලෝවැඩසඟරාව. ලෝකවාසීන්ගේ මෙලොව පරලොව දියුණුවට අදාළ කරුණු සංග්‍රහ කරමින් රචනා කරන ලද නිසා ලෝවැඩ සඟරාව යන නාමය යොදා ඇත. ජන ජීවිතය ගුණ දහමට යොමු කිරීමට අවශ්‍ය බණ දහම් එහි ඇතුළත් බැවින් අද දක්වා ම මහත් සැලකිල්ලෙන් භාවිත කෙරෙන ග්‍රන්ථයකි. "**සද්ධම්මෝපායනය**" නම් පාලි ග්‍රන්ථය ද ඇසුරු කරමින් ලෝවැඩ සඟරාව රචනා කර තිබෙන්නේ බුදුගුණාලංකාරය ලියූ වීදගම මෛත්‍රේය හිමිපාණන් විසින් ම ය. උන් වහන්සේ අපට දෙන, පහත සඳහන් උපදේශය ගැන අපේ අවධානය යොමු කරමු.

| | |
|---|---|
| පින් නොකරන දුදනන් බස් | නාද |
| තුන් දෙස් මල දුරු කර සිත | පාද |
| පන්සිල් නිති අටසිල් රැක | පෝද |
| ඉන් මොක් පුර පැමිණෙව් නොව | බාද |

## සාරාංශය

මිහිඳු මාහිමියන්ගෙන් අපට ලැබුණු දයාද අතර එකකි, බෞද්ධ සාහිත්‍යය. බුදුගුණ, බුදුබණ, බුදුසිරිත වර්ණනා කරමින් රචනා කරන ලද ඉතා රසවත් මෙන් ම හරවත් ගද්‍ය පද්‍ය කෘතිවලින් අපේ සාහිත්‍යය පෝෂිත ය. ඒවා අතරින් අප අවශ්‍යයෙන් ම හැඳින ගත යුතු මූලික කෘති කිහිපයක් ඇත. බුත්සරණ, දහම්සරණ, සඟසරණ, අමාවතුර, සද්ධර්ම රත්නාවලිය, සද්ධර්මාලංකාරය, පූජාවලිය, ජාතක පොත් වහන්සේ, ධර්මප්‍රදීපිකාව, මුවදෙව්දවත, සසදවත, කව් සිළුමිණ, කාව්‍යශේඛරය, ගුත්තිල කාව්‍යය, බුදුගුණාලංකාරය, ලෝවැඩ සඟරාව ඉන් ප්‍රධාන ය. රසවින්දනය සඳහාත් දහම් දැනුම සඳහාත් මෙම ග්‍රන්ථ පරිශීලනය බෙහෙවින් උපකාර වෙයි.

## ක්‍රියාකාරකම්

01. මෙම පාඩමින් ඔබ හැඳිනගත් ග්‍රන්ථ නාමාවලිය අකාරාදී පිළිවෙළට ලියා දක්වන්න.

02. මට්ටකුණ්ඩලී කතාවෙහි එන ඔබ සිත් ගත් උපමාවක් අගය කරමින් වාක්‍ය 10ක පමණ ඡේදයක් ලියන්න.

## පැවරුම

01. පහත සඳහන් කතාවලින් එකක් කියවා එහි කතා ශරීරය ඔබේ වචනයෙන් ලියා ගුරුතුමාගේ නිර්දේශය ඇතිව බිත්ති පුවත්පතේ පළ කරන්න.

| | |
|---|---|
| **ගුත්තිල ජාතකය** | ජාතක පොත් වහන්සේ |
| **මට්ටකුණ්ඩලී වස්තුව** | සද්ධර්මරත්නාවලිය |
| **නාලාගිරි දමනය** | බුත්සරණ |
| **තුන් යහළු වස්තුව** | සද්ධර්මාලංකාරය |

02. ජාතක දේශනා ශෛලිය හුරු කරගෙන බෞද්ධ ශිෂ්‍ය සමිතියේ දී එම ශෛලියෙන් ජාතක කතාවක් ඉදිරිපත් කරන්න.